ඇමුණුම - 01

## "අරෝග්‍යා" වැඩිහිටි මූල්‍යාධාර වැඩසටහන - 2025

- **හැඳින්වීම**

දිවයින පුරා ජීවත්වන, විවිධ බෝනොවන රෝගාබාධයන්ගෙන් පෙළෙන වැඩිහිටියන්ගේ මූල්‍ය දුෂ්කරතා අවම කිරීම වෙනුවෙන් යම් සහනයක් සැලසීම අරමුණු කරගනිමින් අවුරුදු 60 සම්පූර්ණ වූ, පහතින් දක්වා ඇති රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ආධාර ලබාදීම, මෙම වැඩසටහන මගින් සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන " පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් " රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි 2.6 හි සඳහන් " මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන වැඩිහිටි පුද්ගලයින්ට මූල්‍ය ආධාර ලබා දීම" යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා ප්‍රතිලාභීන් 1000 දෙනෙකු සඳහා එක් වැඩිහිටියෙකු වෙනුවෙන් රු. 25,000.00 බැගින්, සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි මුදල් ආධාර ලබාදීමට සැලසුම්කර ඇත.

- **ආධාර ලබාදීමට අපේක්ෂා කෙරෙන රෝගී තත්ත්වයන්**

| | |
|---|---|
| ➢ පිළිකා රෝගය | නිර්දේශිත ප්‍රතිකාර ලබාගනිමින් සිටී නම් පමණක් |
| ➢ වකුගඩු ආශ්‍රිත රෝග | වකුගඩු බද්ධ කිරීමට නිර්දේශිත, කාන්දුකරණය සිදුකරන්නේ නම් හෝ නිදන්ගත වකුගඩු රෝග නිසා එදිනෙදා කටයුතු සඳහා පූර්ණ වශයෙන් අන් අය මත යැපෙන වැඩිහිටි පුද්ගලයන් සඳහා පමණක් |
| ➢ හෘද රෝග | හෘද සැත්කම්, ස්ටෙන්ට් දැමීම වැනි ප්‍රතිකාර සඳහා නිර්දේශ කර හෝ එවැනි සැත්කම් සිදුකර, දීර්ඝකාලීනව ප්‍රතිකාර ලබාගන්නේ නම් හෝ හෘද රෝග නිසා එදිනෙදා කටයුතු සඳහා අන් අය මත යැපෙන වැඩිහිටි පුද්ගලයන් සඳහා පමණක් |
| ➢ ස්නායු රෝග | නිදන්ගත ස්නායු රෝග වන ආඝාතය, පාකින්සන් හෝ ඩිමෙන්ෂියා රෝග තත්ත්වයන් නිසා හෝ අනතුරු නිසා මොළයට හෝ සුසුම්නාවට හානි වීමෙන් ඇඳගතව තමන්ගේ කාර්යයන් ස්වාධීනව කරගැනීමට නොහැකිව සිටී නම් පමණක් |
| ➢ පෙනහළු ආශ්‍රිත රෝග | නිදන්ගත පෙනහළු ආශ්‍රිත රෝගවලින් පෙළෙන ස්වසන අපහසුතා හේතුවෙන් දෛනික කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි අන්අය මත යැපෙන හෝ දීර්ඝකාලීනව ගෘහස්ත ඔක්සිජන් භාවිතය විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් නිර්දේශ කරන ලද වැඩිහිටියන් සඳහා පමණක් |
| ➢ අක්මාව අන්ත්‍රය ආශ්‍රිත රෝග | එදිනෙදා කටයුතු වලදී අන් අය මත යැපෙමින් නිර්දේශිත ප්‍රතිකාර ලබමින් නිදන්ගත අක්මා අගන්‍යාසය හෝ ආන්ත්‍රික රෝගවලින් පෙළෙන වැඩිහිටියන් පමණක් |
| ➢ පූර්ණ අන්ධභාවය | පූර්ණ වශයෙන් අන්ධ භාවය හේතුවෙන් ඇතිවන ශරීර දුර්වලතා නිසා එදිනෙදා කටයුතු සඳහා අන්අය මත යැපෙන වැඩිහිටියන් සඳහා පමණක් |
| ➢ පේශි හා හන්දි රෝග | නිදන්ගත බහුවිධ හන්දි රෝගවලින් පෙළෙන බවට රෝග විනිශ්චයක් ඇති තමන්ගේ එදිනෙදා කටයුතු වලදී පූර්ණ වශයෙන් අන් අය මත යැපෙන වැඩිහිටියන් පමණක් |

| | |
|---|---|
| ➢ අංශභාගය | ඇඳගත හෝ තමන්ගේ කාර්යයන් සිදුකර ගැනීමට නොහැකි තත්ත්වයේ සිටී නම් පමණක් |
| ➢ පාද කපා ඉවත් කිරීම | අදාළ පුද්ගලයා කෘතීම පාදයක් භාවිතා කළයුතු මට්ටමේ පසුවන්නේ නම් (පාදයේ වළලුකර මට්ටමට ඉහළින් පාදය ඉවත් කර ඇත්නම්) පමණක් |

- <u>ව්‍යාපෘතියේ අරමුණු</u>

➢ වැඩිහිටි ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් ඔවුන්ට මුහුණපෑමට සිදුවී ඇති සෞඛ්‍ය ගැටලු අවම කිරීම මගින් යහපත් වැඩිහිටි වියක් අත්කරදීම

➢ රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන වැඩිහිටියන් මුහුණපාන ආර්ථික අපහසුතා අවම කිරීම

- <u>ක්‍රියාත්මක ක්‍රමවේදය</u>

1. **ප්‍රතිලාභීන් තොරාගැනීම සඳහා සුදුසුකම්**

➢ වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද, අඩු ආදායම්ලාභී වැඩිහිටියෙක් වීම

➢ පවුල් ඒකකයක් තුළ එක් වැඩිහිටියෙකු සඳහා පමණක් ආධාර මුදල් සඳහා ඉල්ලීම් කිරීමට හැකි වීම

➢ එක් වැඩිහිටියෙකු වෙනුවෙන් එක්වරක් පමණක් ආධාර මුදල් ලබාගත හැකිවීම

➢ රාජ්‍ය හෝ වෙනත් ආයතනවලින් වකුගඩු රෝගය හෝ මෙහි සඳහන් රෝග සඳහා වැඩිහිටි ජීවනාධාර දීමනාවට වඩා වැඩි මාසික ආධාර ලබමින් සිටින වැඩිහිටියෙකු නොවීම.

➢ වැඩිහිටි ජීවනාධාර දීමනාව හා අවුරුදු 100 ට වැඩි වැඩිහිටියන් වෙත ලබාදෙන දීමනාව ලබන වැඩිහිටියන් සඳහාද මෙම ආධාර මුදල ලබාදිය හැක.

2. **ක්‍රියාත්මක කිරීම**

➢ නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මගින් වැඩිහිටියන් සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාගත යුතුය.

➢ සෑම ඉල්ලුම් කරුවෙකුම තමා පසුවන රෝගී තත්ත්වයට ප්‍රතිකාර ලබාගන්නා වෛද්‍ය වාර්ථාවේ සහතික කරන ලද පිටපතක් ඉල්ලුම්පත්‍රය සමග අමුණා තිබිය යුතුය.

➢ මෙම ආධාර මුදල ලබාදීමට අයදුම්කරු සුදුස්සකු බවට රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි නිර්දේශකළ යුතුය. (මෙහිදී ආසන්නම රෝහලක රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු හට අදාළ නිර්දේශය ලබාදිය හැකිය.)

➢ අදාළ අයදුම්පත් ග්‍රාම නිලධාරි විසින්, පදිංචිය හා අඩු ආදායම්ලාභී බව සනාථ කළයුතු අතර, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි (වැඩිහිටි) / ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන වැඩිහිටි විෂය ආවරණය කරනු ලබන නිලධාරි විසින් ආධාර මුදල ලබාදීම සුදුසු බව සහතික කළයුතුය.

- ➢ අදාළ අයදුම්පත්, සහකාර ප්‍රාදේශීය ලේකම් / අධ්‍යක්ෂ සැලසුම් විසින් නිර්දේශකර, ප්‍රාදේශීය ලේකම් විසින් අනුමතකර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනුගත කළයුතුය.

- ➢ 2025 වර්ෂයට අදාළ ඉල්ලීම් 2025.08.31 දිනට පෙර යොමුකළ යුතුය.

- ➢ අදාළ ඉල්ලීම් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේදී, මේ සමග ඇති ඇමුණුම 02 ආකෘතිය මගින් පමණක්, අදාළ සියලු තොරතුරු ඇතුළත් කොට, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව, නියමිත පරිදි ඉල්ලීම් කළ යුතුය.

- ➢ ඉල්ලීම් ආකෘතිය මගින් තොරතුරු ඇතුළත් කිරීමේදී, ඉහත දක්වා ඇති පරිදි රෝගී තත්ත්වයන් නිවැරදිව සඳහන් කළයුතු අතර, ඉන් පරිබාහිර රෝගී තත්ත්වයන් සඳහා ආධාර ලබාදෙනු නොලැබේ.

- ➢ 2025 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා ප්‍රතිලාභීන් තුන්දෙනෙකු (03) වෙත ප්‍රතිපාදන ලබාදෙන අතර, වර්ෂය තුළ ප්‍රතිපාදන ඉතිරිවීම මත අනෙකුත් ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිපාදන ලබාගැනීමේ හැකියාව පවතී. ඒ අනුව, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් උපරිම වශයෙන් වැඩිහිටියන් පස්දෙනෙකු (5) සඳහා ආධාර ඉල්ලීම් කළ හැකි අතර, එම ප්‍රතිලාභීන් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඉදිරිපත් කළයුතුය.

- ➢ මෙම ආධාර මුදල් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදෙනු ලබන අතර, ආධාර හිමි ප්‍රතිලාභීන් වෙත එම මුදල් කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය.

- ➢ යම් හේතුවකින් ප්‍රතිලාභියෙකු වෙත ආධාර ලබාදීමට නොහැකි වන්නේ නම්, (මියයාම, පදිංචිය හැර යාම හෝ වෙනත් නොවැලැක්විය හැකි හේතුවක් මත) එම මුදල, ප්‍රමුඛතා ලේඛනයේ ඊළග ඉල්ලුම්කරු වෙත ලබාදීමට හැකියාව ඇති ඇතර, ඒ සඳහා ඇමුණුම 02 ආකෘතිය අනුව නව ප්‍රතිලාභියාගේ තොරතුරු සහිතව, ලිඛිත ඉල්ලීමක් මගින් අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

- ➢ එමෙන්ම ආධාර වෙනුවෙන් යවන ලද මුදලක් නැවත එවන්නේ නම්, වැඩිහිටි තැනැන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල (NATIONAL FUND FOR THE WELFARE OF ELDERS -228075) නමින් ලියන ලද චෙක්පතක් මගින් යොමු කිරීමට හෝ අදාළ ගිණුමට තැන්පත් කිරීමට හැකියාව ඇත.

3. <u>අධීක්ෂණය හා පසුවිපරම් සිදුකිරීම</u>

- ➢ ආධාර මුදල් ලබාදීම සම්බන්ධ අධීක්ෂණය හා පසු විපරම් කටයුතු විෂය සම්බන්ධ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් යුතුව ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් සිදුකළ යුතුය.

- ➢ චෙක්පතට අදාළ කුවිතාන්සිය (චෙක්පතට අදාල ලදුපත) හා වැඩිහිටියන් වෙත ආධාර මුදල් ලබාදීම සම්බන්ධ වාර්තාව, ඇමුණුම 04 මගින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

කේ. චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය